# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

**53 A, ඩී.එස්.ෆොන්සේකා පාර, කොළඹ - 05, ශ්‍රී ලංකා**

දුරකථන / ෆැක්ස් : 2556629 ඊ-මේල් : slpia@sltnet.lk / slpiaexco@gmail.com වෙබ් අඩවිය : www.slpia.lk


මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/29/21 ඔබේ අංකය :

2021.02.23

සී.ඩී. වික්‍රමරත්න මහතා,
පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

<u>නීති විද්‍යාලයේ අවසන් වසර පරීක්ෂණ සඳහා පෙනී සිටින නිලධාරීන් සම්බන්ධව.</u>

ශ්‍රී ලංකා පොලිසිය මගින් ලබාදුන් අවස්ථාව අනුව දැනට නීතිවේදී උපාධිය සමත්ව ශ්‍රීමත් ජෝන් කොතලාවල හා විවෘත විශ්ව විද්‍යාල මගින් නීතිවේදී උපාධිය හදාරන නිලධාරීන් 20 ක් පමණ මෙවර අවසන් වසර පරීක්ෂණය සඳහා පෙනී සිටීමට නියමිතව ඇත.

2019.09.04 වන දින පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ සාමාජිකයින් සහ ඔබතුමා සමග පැවති සාකච්ඡාවේදී අප විසින් කරන ලද ඉල්ලීමට අනුව, උපාධිය සඳහා සහභාගී වන නිලධරයන් හට අධ්‍යයන කටයුතු සහ එම විභාග සඳහා පෙනී සිටින අවස්ථාවන් වලදී ඒ සඳහා රාජකාරී කටයුතු වලින් නිදහස් කර රාජකාරි නිවාඩු ලබා දෙන ලෙසට ඔබතුමා විසින් අදාල රාජ්‍ය නිවේදිත නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදි.

එබැවින් දැනට නීතිවේදී උපාධිය සමත්ව ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් වසර පරීක්ෂණය සඳහා පෙනී සිටීමට නියමිත නිලධාරීන් සඳහා අධ්‍යයන නිවාඩු ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි.
නීතිවේදී (ගෞරව),
පොලිස් පරීක්ෂක,
ලේකම්,
පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය.

නීතිඥ ප්‍රගීත් ප්‍රේමසිරි
නීතිවේදී (ගෞරව)
ගරු ලේකම්,
ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

පිටපත :- නියෝජ්‍ය පොලිස්පති / පොලිස් අභ්‍යාස ආයතනය සහ සේවස්ථ පුහුණු දිසාව.

**අභිමානවත් පොලිසියක් ගොඩනගමු.**